# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 48 දරන මුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 දෙසැම්බර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 දෙසැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. **9.50** යි. **තැපැල් ගාස්තුව :** රු. **5.00** යි.

## 2006 අංක 48 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 දෙසැම්බර් මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 77/2006.

**2002 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2006 අංක 48 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (2006 අංක 11 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත) 2002 අංක 11 දරන මුදල් පනතේ I වන කොටසේ (වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද) 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— 2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ පළමුවන අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද, ඉහත සඳහන් කර ඇති යම් භාණ්ඩයක පිරිවැය, රක්ෂණය සහ නැව් ගාස්තු සම්බන්ධයෙන්—

(අ) 2004 නොවැම්බර් මස 19 වන දිනයෙන් ආරම්භ වී 2005 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට 1.5 ක අනු ප්‍රමාණයක වූ බද්දක් ;

(ආ) 2006 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2006 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට 2.5 ක අනු ප්‍රමාණයක බද්දක් ;

(ඇ) 2007 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාලසීමාව සඳහා සියයට 3.0 ක අනු ප්‍රමාණයක බද්දක් ;

පනවා අයකර ගනු ලැබිය යුතු ය."; සහ

(2) ඒ වගන්තියේ දෙවන අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් :—

"එසේම තවදුරටත්, අමාත්‍යවරයා විසින් ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන කලින් කල ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් —

(අ) එම නියමයේ නිශ්චිතව සඳහන් යම් අයිතමයක්, ඉහත සඳහන් බද්ද ක්‍රියාත්මක කිරීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය ; හෝ

(ආ) එම නියමයේ නිශ්චිතව සඳහන් යම් අයිතමයක් හෝ අයිතම සම්බන්ධයෙන් අනුග්‍රාහක අනුප්‍රමාණයක් පනවා අය කිරීමට නියම කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයා විසින් මේ අතුරු විධානය ප්‍රකාර කරනු ලබන සෑම නියමයක් ම—

(i) එම නියමය මත අමාත්‍යවරයා විසින් සිය අත්සන තැබූ වහාම එම නියමය ක්‍රියාත්මක විය යුතු ය ;

(ii) හැකි පහසු ඉක්මණින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය ;

(iii) ඉන් පසු හැකි පහසු ඉක්මණින් පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබිය යුතු ය ;

(iv) පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබුවහොත්, එම යෝජනා සම්මතයේ දින සිට බලපවත්වන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.".

පනත ක්‍රියාත්මක වීම.

**3**. මේ කොටසේ විධිවිධාන 2007 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2006 අංක 11 දරන මුදල් පනතේ V වන කොටසේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 2006 අංක 11 දරන මුදල් පනතේ V වන කොටසේ 14 වන වගන්තිය, එහි සඳහන් "2005 අංක 6 දරන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2005 අංක 5 දරන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.